# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 201 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 04/02/2024 පැය 1130

**මාධ්‍ය නිවේදනය**

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2024.02.03 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 01 | 01 | 26 | 76 | තඹ දඟර 01<br>යකඩ බැරල් 01 |

වැටලීමක් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරු හා දේපල වාලච්චේන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**02. නීති විරෝධීව මෙරටට ගෙන්වන ලද බීඩි කොළ තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සීදූව උප මුරපොල.**

2024.02.02 වන දින උදෑසන කාලයේ පමුණුගම පොලිස් වසමේ උස්වැටකෙයියාව දුන්ගල්පිටිය මාර්ගයේදී පොලිස් විශේෂ කාර්ය බලකා සීදූව උප මුරපොල නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර නීති විරෝධීව මෙරටට ගෙන්වන ලද බීඩි කොළ කිලෝ ග්‍රෑම් 2058 ග්‍රෑම් 300 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන කටුනායක ශ්‍රී ලංකා රේගුව උප නිවාරණ කාර්යාලයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වූ පිටිපන ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** කටුනායක ශ්‍රී ලංකා රේගුව උප නිවාරණ කාර්යාලය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03.** **අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කලවංචිකුඩි කඳවුර.**

2024.02.03 වන දින උදෑසන කාලයේ කාත්තන්කුඩි පොලිස් වසමේ දී පොලිස් විශේෂ කාර්ය බලකා කලවංචිකුඩි කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 04 මිලි ග්‍රෑම් 760 ක් හා ජංගම දුරකථනයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන කාත්තන්කුඩි පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වූ මඩකලපුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** කාත්තන්කුඩි පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**